# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2263/38 – 2022 ජනවාරි මස 21 වැනි සිකුරාදා – 2022.01.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස – පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත (262 වන අධිකාරයවූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66ආ(2) වගන්තිය යටතේ කෑගල්ල නගර සභාවේ උප සභාපති ධුරයේ පුරප්පාඩුව පිරවීම**

මියයාම හේතුකොට ගෙන කෑගල්ල නගර සභාවේ උප සභාපති ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66ආ(2) වන වගන්තිය යටතේ තනතුර දරූ උප සභාපති වන කරඳන ආචාරිගේ ලලිත් ජයශාන්ත අයත් වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහක (30) කාල පරිච්ඡේදය ඇතුළත උප සභාපති වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම කෑගල්ල නගර සභාවේ උප සභාපති පිළිබඳව තීරණය කිරීමට, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින්ද,

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා කත්‍රි අච්චිගේ රසික ඉදුනිල් පෙරේරා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

කෑගල්ල නගර සභාවේ තේරීම්භාර නිලධාරි, සජිත් වසන්ත වෙල්ගම වන මම, 2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරයවූ) 66ආ(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් කත්‍රි අච්චිගේ රසික ඉදුනිල් පෙරේරා, කෑගල්ල නගර සභාවේ උප සභාපති වශයෙන් තෝරා පත් කරගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

**සජිත් වසන්ත වෙල්ගම,**
තේරීම්භාර නිලධාරි,
කෑගල්ල නගර සභාව.

2022 ජනවාරි මස 20 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කෑගල්ල.

EOG 01-0228

1A – G 35881 – 20 (2022/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*